රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 1/89 (1)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1991 අප්‍රේල් මස 23 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීයන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල
ලේකම්වරුන් හා දිසාපතිවරුන් වෙත,

## පළාත් පාලන ආයතනවලට සහ පළාත් සභාවලට තේරී පත්වන රාජ්‍ය නිලධාරීහු

1989.01.05 දිනැති අංක. 1/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද ආයතන සංග්‍රහයේ xxxii වැනි පරිච්ඡේදය පහත සඳහන් පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

02. එහි 2:3:4 හා 3:7 දරණ උප වගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කරන්න.

> " 2:3:4 ඔහු පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස තෝරා පත් කර ගනු ලැබුව හොත් රජයේ සේවයේ ඔහු දරමින් සිටි තනතුරින් ඉල්ලා අස්වන ලෙස ඔහුට නියම කරනු නොලැබේ. එහෙත් පළාත් පාලන ආයතනයේ රුස්වීම්වලට සහභාගීවීම සඳහා සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ඔහුට දිය යුතුය.

යම් රාජ්‍ය නිලධරයකු පළාත් සභාවක සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහුට පහත සඳහන් මනාප දෙකින් ඕනෑම මනාපයක් භුක්ති විඳීමට ඉඩ දිය යුතුය.

1 වන මනාපය - ඔහු පළාත් සභාවේ සභිකයෙකු වශයෙන් සිටිනතාක් කල් වැටුප් රහිත නිවාඩු පිට එම පළාත් සභාවේ සභිකයෙකු වශයෙන් සේවය කිරීමට හැකිවන සේ පූර්ණ කාල පදනමක් පිට මුදා හළ යුතුය.

2 වන මනාපය - තෝරා ගනු ලැබීමෙන් පසු ඔහු පහත සඳහන් කොන්දේසි වලට යටත්ව රජයේ සේවය හැර ගියාසේ සැලකිය යුතුය.

(1) පළාත් සභාවට ඔහු තෝරා පත් කර ගනු ලබන අවස්ථාවේදී රජයේ සේවයෙහි ඔහුගේ නිත්‍ය තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් සේ ප්‍රකාශයට පත් කර ඇති තනතුරක් නම් එවිට,

(අ) පළාත් සභාවට තෝරා පත් කර ගනු ලබන දිනයේ දී තනතුර අහෝසි කිරීම නිසා ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නේ නම්, ඔහුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ප්‍රදානය කළ යුතුව ඇති ආකාරයේ ප්‍රදාන ලබා ගැනීමට ඔහු සුදුසු වන්නේය.

(ආ) එසේකුදු වුවත් පළාත් සභාවේ සභිකයෙකු වීමේ තත්ත්වය නැවතීම නිසා පළාත් සභාවේ ඔහුගේ සේවය අවසන් කෙරෙන තෙක් එම විශ්‍රාම ප්‍රතිලාභ ඔහුට නොගෙවිය යුතුය.

(ඇ) පළාත් සභාවේ සේවයේ යෙදී සිටියදී ඔහු මිය ගියහොත්, ඔහු පළාත් සභාවට තේරී පත්වූ දිනට පෙරදින මිය ගියාසේ සලකා විශ්‍රාම ප්‍රතිලාභ ඔහුගේ යැපෙන්නන්ට ගෙවිය යුතුය.

11. පළාත් සභාවට තෝරා පත් කර ගනු ලබන අවස්ථාවේදී ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනත යටතේ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවූ තැනැත්තෙක් වූයේ නම් එම ආඥා පනතේ කාර්යයන් සඳහා ඔහු සේවයෙන් පහ කිරීම නිසා නොව රජයේ කැමැත්ත ඇතිව සිය කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලැබීම නිසා රජයේ සේවය අත්හැර ගිය අයෙකු සේ සැළකිය යුතුය. තවද,

111. පළාත් සභාවට ඔහු තෝරා ගනු ලබන අවස්ථාවට කලින්, නියමිත කාල පරිච්ඡේදයක් රජයට සේවය කරන බවට ගිවිස ගනිමින් රජය සමඟ කොන්ත්‍රාත්තුවක් ඔහු අත්සන් කර ඇත්නම් එබඳු කොන්ත්‍රාත්තුවක් හා සම්බන්ධ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා පළාත් සභාවට සිදු කරනු ලබන ඕනෑම සේවා කාලයක් රජයට කරනු ලබන සේවයක් වශයෙන් සැළකිය යුතුය.

" **3:7** දේශපාලන අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හිමිකම් ඇති නිලධරයකු පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහු එසේ තේරී පත්වී සිටින පළාත් පාලන ආයතනයේ කාර්යාලයට ආසන්න සේවා ස්ථානයක සේවය කිරීමේ අනුග්‍රහය සේවයේ අවශ්‍යතාවයන්ට සහ විනය අවශ්‍යතාවයන්ට යටත්ව, ඔහුට ලබාදිය යුතුය. එම පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ සභිකයෙකු වශයෙන් සේවය කරන තාක් ඔහු සාමාන්‍ය ස්ථාන මාරු කිරීම්වලට යටත් නොවන්නේය."

**03.** මෙම විධිවිධාන **1988.04.27** දින සිට ක්‍රියාත්මක වේ.

අ.කළේ./ (ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.